# 2. ජීවී දේහ සංවිධානය

## සැණ විමසුම

# SCIENCE

## Quick Reference



Copyright © e-thaksalawa.moe.gov.lk

# 2. ජීවී දේහ සංවිධානය

## සත්ත්ව සෛලයක් හා ශාක සෛලයක් අතර ඇති වෙනස්කම්

### සත්ත්ව සෛලය

- සෛල බිත්තියක් නැත.
- විශාල රික්තක නැත.
- හරිතලව නැත.

### ශාක සෛලය

- සෛල බිත්තියක් නැත.
- විශාල රික්තක නැත.
- හරිතලව නැත.

# සෛල තුළ ඇති ඉන්ද්‍රියිකා සහ ඒවායේ කෘත්‍යයන්

**න්‍යෂ්ටිය**

- සෛලයේ පාලක මධ්‍යස්ථානයයි.
- මෙය තුළ ආවේණික ලක්ෂණ රැගත් වර්ණදේහ පිහිටා ඇත.

**මයිටොකොන්ඩ්‍රියම**

- මෙය තුළ සෛලීය ශ්වසනය සිදුවේ.

**ගොල්ජිදේහ**

- පරිවහන ක්‍රියාවලිය සිදුකරන මධ්‍යස්ථානයයි.
- මේවා තුළ හෝමෝන, එන්සයිම සහ ප්‍රෝටීන නිපදවයි.

**අන්තඃ ප්ලාස්මීය ජාලිකාව**

- න්‍යෂ්ටික ද්‍රව්‍ය වෙනත් සෛලවලට පරිවහනය කරයි.

## හරිතලව

- ප්‍රභාසංස්ලේෂණය සිදුකරන මධ්‍යස්ථානයයි.

## සෛල ප්ලාස්මය

- මෙහි විවිධ ද්‍රව්‍ය දියවී පවතී. උදා. පෝෂක ද්‍රව්‍ය

## සෛල පටලය

- අර්ධ පාරගම්‍ය පටලයකි.

## සෛල බිත්තිය

- ඕනෑම ද්‍රව්‍යයකට පාරගම්‍ය වේ. ශාක සෛලවල පමණක් ඇත.

# ශාක සහ සත්ත්ව පටකවල විවිධත්වය

## ශාක පටක

### දෘඪස්තර පටකය

- මේවා අජීවී සෛල වේ. ලිග්නීන් තැන්පත් වීමෙන් දැඩිබවට පත්වී ඇත.
  උදා. තන්තු, උපල සෛල

### ස්ථූල කෝණාස්තර පටකය

- සෙලියුලෝස්වලින් ඝන වූ ශීර්ෂ සහිත බහුඅස්‍රාකාර සෛල වේ.
  උදා.පත්‍ර නාරටි, ළපටි කදන්

### මෘදූස්තර පටකය

- ගෝලාකාර, සම විෂ්කම්භ සජීවී සෛලවලින් සෑදී ඇත.
  උදා. ඉනි සෛල, සවිවර සෛල, හරිතප්‍රද අඩංගු සෛල

## සෛලම පටකය

- මුල්වලින් අවශෝෂණය කරන ජලය සහ ඛණිජ ලවණ පරිවහනය කරයි.
- වාහිනී, වාහකාභ, තන්තු සහ මෘදුස්තර සෛලවලින් සමන්විත වේ.

## ප්ලෝයම පටකය

- ආහාර පරිවහනය සහ සංචිත කිරීමේ කාර්යය ඉටු කරයි.
- පෙනේර නල ඒකක, සහචර සෛල, තන්තු සහ මෘදුස්තර සෛලවලින් සෑදී ඇත.

# සත්ත්ව පටක

## රුධිර පටකය

- දේහාණු සහ රුධිර ප්ලාස්මාවෙන් සෑදී ඇත.
- විෂබීජවලට එරෙහිව ක්‍රියාකරයි.
- සිරුර පුරා ද්‍රව්‍ය පරිවහනය කරයි.

## අපිච්ඡද පටකය

- ශරීර අවයව ආස්තරණය කිරීම මෙම පටකයේ කාර්යය වේ.

## පේශි පටකය

- මෙම සෛල දිගැටි ය.
- පේශි පටක වර්ග තුනක් ඇත.

  සිනිඳු පේශි, කංකාල පේශි, හෘත් පේශි

| සිනිඳු පේශි | කංකාල පේශි | හෘත් පේශි |
|---|---|---|
| තර්කුරූපී ය. | තර්කුරූපී නැත. | තර්කුරූපී නැත. |
| නිර්විලිඛිත ය. | විලිඛිත ය. | විලිඛිත ය. |
| ඒක න්‍යෂ්ටික ය. | බහු න්‍යෂ්ටික ය. | ඒක න්‍යෂ්ටික ය. |
| අනිච්ඡානුග ය. | ඉච්ඡානුග ය. | අනිච්ඡානුග ය. |

# ජීවීන්ගේ දේහ සංවිධාන රටා

**ජීවීන්ගේ  දේහ තුළ සංකීර්ණ ජීව ක්‍රියා රැසක් සිදුවේ.**

**ඒ සඳහා සැකසුණු පද්ධති කීපයක් දේහය තුළ වෙයි.**

උදා.

- ආහාර ජීරණ පද්ධතිය
- ශ්වසන පද්ධතිය
- බහිස්‍රාවීය පද්ධතිය
- රුධිර සංසරණ පද්ධතිය
- ස්නායු පද්ධතිය
- ප්‍රජනක පද්ධතිය

# ජීවීන්ගේ දේහ සංවිධාන රටා

එක්ව ක්‍රියාකරන ඉන්ද්‍රියයන් කීපයකින් පද්ධතියක් නිර්මාණය වේ.

ඉන්ද්‍රියයන් සෑදී ඇත්තේ පටක වලිනි.

පටක සෑදෙන්නේ සෛල එක්වීමෙනි.

මේ අනුව ජීවීන්ගේ දේහ සංවිධානයේ අනුක්‍රමාධිපත්‍යය වනයේ........

සෛලය → පටක → ඉන්ද්‍රිය → පද්ධති → ජීවියා

# 2. ජීවී දේහ සංවිධානය

## සැණ විමසුම

# SCIENCE

## Quick Reference



Copyright © e-thaksalawa.moe.gov.lk